---

**මුලටියන ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය**

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 30 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 ජුලි 19 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 දෙසැම්බර් 23 දින සභාවේ සභාපතිවරයාවෙත යවා ඇත.

1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මුලටියන ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව අවිනිශ්චිත ගිණුමේ රු.36,289 ක ආරම්භක බැර ශේෂය ජර්නල් අංක 15 මගින් කිසිදු පදනමකින් තොරව සමුච්චිත අරමුදලට බැරකර තිබුණි.

(ආ) 2011 වර්ෂයේ සිට බැංකු සැසඳුමේ දැක්වෙන රු.958,295 ක් වූ සෘජු බැංකු හර කිරීම් ජර්නල් සටහන් අංක 33 මගින් හඳුනාගැනීමකින් තොරව සමුච්චිත අරමුදල් ගිණුමට බැර කර තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු වටිනාකම රු.3,887,170 ක් වුවද සමාලෝචිත වර්ෂයේදී රු.5,653,920 ක් ලැබී තිබුණි. රු. 1,766,750 ක අතිරික්ත ලැබීම් මූල්‍ය ප්‍රකාශන වල ගැලපුම් කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු රු.192,349 ක උසාවි දඩ මුදල ලැබිය යුතු ආදායම් යටතේ ගිණුම් ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුල ලැබිය යුතු කඩ කුලී, බදුකුලී, පොල බදු රු.578,073 ක ආදායම් වටිනාකම ගිණුම් වල පෙන්නුම් කර නොතිබුණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයේ ගිණුම් විෂයයන් 09 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.13,531,652 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂයන්ගේ එකතුව රු.13,746,476 ක් වූයෙන් වෙනස රු.214,824 ක් විය.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ගිණුම් ශේෂවල අවුරුදු 01 කාලයක් ඉක්මවා තිබූ ශේෂයන්හි එකතුව රු.269,168 ක් වූ අතර ගෙවිය යුතු ගිණුම් ශේෂවල අවුරුදු 01 කාලයක් ඉක්මවා තිබූ ශේෂයන්හි එකතුව රු.95,519,394 ක් විය.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

ගිණුම්වල ඇතුළත් රු.123,543,049 ක් වටිනා ගිණුම් විෂයයන් 08 ක් සාක්ෂි නොමැතිවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,464,683 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.7,357,242 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට හිඟය |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 49 | 41 | 8 |
| (ii) | බදු කුලී | 2,649 | 2,563 | 86 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 582 | 766 | 184 |
| (iv) | වෙනත් ආදායම් | 12,247 | 6,279 | 5,968 |

2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (අ) | උසාවි දඩ | 192,549 |
| (ආ) | මුද්දර ගාස්තු | 3,858,022 |

2.4 අවිධිමත් ගනුදෙනු

දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයාගේ හා 2005 ඔක්තෝබර් 05 දිනැති අංක 1413/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද නිවේදනයේ විධිවිධාන පරිදි මාසික දීමනා ගෙවීමේදී අදාල මාසයේ පවත්වන ලද සභා රැස්වීම් සහ කාරක සභාවලට සහභාගී වී නොමැති මන්ත්‍රිවරුන් සඳහා දීමනා නොගෙවිය යුතු බව දක්වා ඇතත් 2012 වර්ෂයේදී සභා රැස්වීම් 11 කට සහභාගී නොවූ මන්ත්‍රිවරුන් 11 දෙනෙකු සඳහා රු.138,000 ක මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දකුණු පළාත් සංවර්ධන සැලැස්ම 2012 මන්ත්‍රි ප්‍රතිපාදන යටතේ සංවර්ධන යෝජනා 02 ක් සඳහා ලැබී තිබූ රු.70,000 ක මුදල වැයකර නොතිබුණි.

(ආ) 1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ පනත පරිදි එකී ප්‍රාදේශීය සභාවේ සභාපති, උප සභාපති ඇතුළු සභිකයින් දොලොස් දෙනෙකු 2012 වර්ෂයේදී වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 29 දෙනෙකු වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 41 දෙනෙකු විය. සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන කොමසාරිස් වෙතින් කාර්යය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා ලෙස රු.8,490,950 ක මුදලක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර වර්ෂයේ වැටුප් වියදම රු.10,424,940 ක් වූයෙන් සභා අරමුදලට රු.1,933,990 ක අතිරේක වැය බරක් ඇතිවී තිබුණි.

(ඈ) 2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය සහ අත්තිකාරම් ශේෂවල එකතුව රු.2,353,587 ක් විය.

---

2.6 නිශ්ක්‍රීය වත්කම්

2008 වර්ෂයේදී රු.150,000 ක මුදලකට මිලදී ගෙන තිබූ කොන්ක්‍රීට් මිශ්‍රකය විගණන දිනය වූ 2013 ඔක්තෝබර් 02 දිනට භාවිතයෙන් තොරව තබා තිබුණි.

2.7 අභ්‍යන්තර විගණනය

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණනය හා කළමනාකරණ කමිටුව පිහිටුවා නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය